# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍රවේදී විශේෂ/අධ්‍යයන ධාරා උපාධි පරීක්ෂණය (භූගෝල විද්‍යාව) - දෙවන භාගය
## දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය – 2018

# GYG 3264 – නාගරික පරිසරය සහ කළමනාකරණය

**කාලය පැ. දෙකයි (02)**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න.

---

**I කොටස**

1. (i). නාගරික දූෂණය පිළිබඳ දර්ශකයට අදාළ නිර්නායක සඳහන් කරන්න.

(ලකුණු 02)

(ii). ජල දූෂණයට බලපාන හේතු සාකච්ඡා කරන්න.

(ලකුණු 03)

(iii). නිශ්චිත නිදසුන් දෙමින් සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරික ජල දූෂණය අවම කිරීම සඳහා යොදාගත හැකි විසඳුම් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

2. (i). "අක්‍රමවත් නාගරික ප්‍රසාරණය" (Urban sprawl) යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(ii). අක්‍රමවත් නාගරික ප්‍රසාරණයට බලපාන හේතු කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii). නාගරික භූමි පරිභෝගයේ වෙනස්වීම හා සම්බන්ධ ගැටලු නිදසුන් ඇසුරින් විමසන්න.

(ලකුණු 12)

3. (i). නාගරික අපද්‍රව්‍ය විවෘත භූමිවල ගොඩගැසීම නිසා නාගරික ප්‍රදේශයක ස්වභාවික පරිසරයට ඇතිවන බලපෑම කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05 )

(ii). නාගරික පරිසර දූෂණය නිසා ඇතිවන සමාජයීය ප්‍රතිඵල සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

## II කොටස

4. (i) බහු න්‍යෂ්ටි ආදර්ශකයට (Multiple Nuclei Model) අනුව නාගරික නේවාසික කලාප හඳුන්වන්න.

(ලකුණු 03)

(ii) ඉහත 4(i) ප්‍රශ්නයේදී ඔබ සඳහන් කළ නේවාසික කලාපවල දැකිය හැකි අසමානතා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) නාගරීකරණ ක්‍රියාවලිය කෙරෙහි කර්මාන්ත සංවර්ධනයේ බලපෑම අග්නිදිග ආසියාතික කලාපයට අදාළ භූමි පරිභෝග ආදර්ශකය ඇසුරින් විමසන්න.

(ලකුණු 12)

5. (i) නාගරික කළමනාකරණයේදී විවිධ වගකීම් දරන්නන්ගේ (stakeholders) කාර්යභාරය කෙටියෙන් සාකච්ජා කරන්න.

(ලකුණු 05)

(ii) තිරසාර නගර සහ ප්‍රජාවන් (Sustainable cities and Communities) යන ඉලක්කය සපුරා ගැනීමේ දී තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) කෙතෙක් දුරට වැදගත් වේදැයි සාකච්ජා කරන්න.

(ලකුණු 15)

6. (i) නීල හරිත නගරය (Blue-Green city) යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 03)

(ii) නීල හරිත නගරයක් නිර්මාණය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) ''තිරසාර පුරවරයක් සඳහා තෙත් බිම් සුරකිමු'' යන්න 2018 ලෝක තෙත්බිම් දිනයෙහි තේමාව වශයෙන් රම්සා සම්මුතිය විසින් ප්‍රකාශයට පත්කරන ලදි. ඉහත තේමාව නිදසුන් සහිතව විස්තරාත්මකව විමසන්න.

(ලකුණු 12)

⓿⓿⓿⓿⓿⓿⓿⓿⓿⓿